INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**2018 අප්‍රේල් 23**

## මාධ්‍ය නිවේදනය: අපරාධකරුවන්ගේ ලැයිස්තුවක් ITJP එක්සත් ජාතීන්ගේ සංවිධානයට භාරදෙයි

ලන්ඩන්: එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි වල යෙදීම තහනම් කළ යුතු පනස් දෙනකුට වැඩි ශ්‍රී ලංකාවේ පොලිස් විශේෂ කාර්ය සාධක බලකායේ (STF) පිරිසකගේ රහස්‍ය නාම ලේඛනයක් ITJP විසින් සම්පාදනය කොට තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසා ඇති පරිදි යුද්ධයේ අවසාන භාගයේ දී ආයතනගතව අපරාධ සිදුකළ බවට STF ඇතුළු  ශ්‍රී ලංකා ආරක්ෂක අංශ චෝදනා ලබයි. නම් කොට ඇති පුද්ගලයන් එක්කෝ අපරාධ කළ බවට චෝදනා එල්ල වුවන්ය. නැතහොත් යුද්ධයේ අවසාන භාගයේ යුද පෙරමුණේ සටන් වැදුනවුන්ය. එම ලැයිස්තුව භාරදෙනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ සාමසාධක දෙපාර්තමේන්තුව (DPKO) සහ ජිනීවාහි මානව හිමිකම් මහකොමසාරිස් කාර්යාලය (OHCHR) වෙතය.

"අප්‍රිකාවේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුමක රාජකාරියේ නිරත වී සිටින ලෙසට දැක්වෙන එක් STF නිලධාරියෙක් 2006-7 සමයේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ දෙමළ අය ඝාතනය කළ බවට චෝදනා ලබා සිටී," යි ITJP විධායක අධ්‍යක්ෂිකා යස්මින් සූකා පැවසුවාය. "මෙයින් පැහැදිලිවම පෙනී යන්නේ සාමසාධනය සඳහා ශ්‍රී ලාංකිකයන් පූර්ව පරීක්ෂණයට ලක් කිරීම සම්බන්ධ වගකීම ඉටුකිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය තවමත් අසමත්ව සිටින බවයි."

ITJP ලැයිස්තුවේ ඇතුලත් දෑ:

-ශ්‍රී ලංකාවේ බරපතල මානව හිමිකම් උල්ලංඝන හා සම්බන්ධ හෝ ඒවාට වගකිව යුතු STF 24 දෙනකුගේ නම්
-ශ්‍රී ලංකාවේ යුද පෙරමුණේ සටන් වල නිරත වී සිටීම හේතුකොට ගෙන එජා සාමසාධන රාජකාරි වල යෙදීම තහනම් කළ යුතු STF නිලධාරීන් 32 ක නම්

ශ්‍රී ලාංකික සාමසාධක භටයන් 2016 දී මාලි බලා යාමට පෙර ජිනීවාහි මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) විසින් පූර්ව පරීක්ෂාවක් සිදුකොට යුද්ධයේ අවසාන භාගයේ ඉදිරි පෙරමුණේ සටන් වැදුනු අය ඉවත් කරන ලදී.

“දැන් පොලිස් කොමාන්ඩෝ භටයන් එජා සාමසාධක භටයන් ලෙසින් විදේශ වලට යවනු ලබන අතර ඔවුන්ද යුද හමුදාව සේම දැඩි පූර්ව පරීක්ෂාවකට යටත් කළ යුතුය,” යි යි ITJP විධායක අධ්‍යක්ෂිකා යස්මින් සූකා පැවසුවාය.

“සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීමේ කොන්දේසියට යටත්ව, මේ ක්‍රියාදාමයට සහාය දීමට අපි කැමැත්තෙන් සිටිමු. වින්දිතයන්ගේ ප්‍රකාශ පමණක් නොවේ, අභ්‍යන්තර සාක්ෂිකරුවන් ලබාදුන් තොරතුරු, ඡායාරූප සහ නම් ද ඇතුලත් විශාල දත්ත ගබඩාවක් ඇති එකම කණ්ඩායම අපය,” යි සූකා මහත්මිය වැඩිදුරටත් පැවසුවාය.

කලින් STF හි සේවය කළ සිංහල පුද්ගලයන් සහ ඔවුන් සමග කටයුතු කළ දෙමළ අතුරු හමුදා කල්ලි සාමාජිකයන් ගේ ප්‍රකාශ මත මූලික වශයෙන් පදනම් වෙමින් පොලිස් විශේෂ කාර්ය සාධක බලකාය පිලිබඳ අලුත් වාර්තාවක් ITJP විසින් සඳුද නිකුත් කරන ලදී.

තවමත් මානසික කම්පාවට ගොදුරු වී සිටින එක සිංහල පුද්ගලයෙක් කොළඹ සුදු වෑන් පැහැර ගැනීම් සිදුකළ කණ්ඩායමක තමන් කළ වැඩ කටයුතු හඳුන්වා දුන්නේ “ත්‍රාසජනක චිත්‍රපටියක්” ලෙසටය.

යුද්ධයේ අවසාන සමයේ ක්‍රියාකාරීව සිටි තවත් ප්‍රශ්න කරන්නෙක් තමන්ට ගොදුරුවූ වින්දිතයන් ගැන මෙසේ සඳහන් කළේය; “අපි උන්ගේ උගුරු දණ්ඩ කැපුවා, බෙල්ල මිරිකුවා, පිහියෙන් ඇන්නා නැතිනම් මැරෙන කල් ගැහුවා”.

තමන්ගෙන් පීඩාවට පත් සැමදෙනාම අවසානයේ මරාදමන ලද බව ඔවුහු කියා සිටියහ.

වෙනත් ආරක්ෂක හමුද කණ්ඩායම් තවමත් සිදුකරන පැහැරගැනීම්, වධහිංසා සහ ලිංගික හිංසන ගැන ITJP විසින් ලේඛනගත කොට ඇතත්, STF පැහැරගැනීම් කල්ලි වර්තමාන රජය යටතේ තවමත් ක්‍රියාත්මක වන බවක් දැනගන්නට නැත.

ඇතැම් STF නිලධාරීන් ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ දී හිරකරුවන් නඩු නොඅසා මරා දැමීමත්, වෙනත් කණ්ඩායමකට වරද පැටවෙන සේ ප්‍රහාර දියත් කිරීමත්, ලිංගික ප්‍රචණ්ඩතා සඳහා අනුබල දීමත් සිදුකළ ආකාරය සාක්ෂිකරුවන් විසින් විස්තර කර තිබේ. පැහැරගැනීම් සහ ළමුන් බඳවා ගැනීම එල්ටීටීඊ සංවිධානයෙන් බෙදී වෙන්වුනු කරුණා කණ්ඩායමේ යුද උපායේ මූලික අංගයක් බව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පෙන්වා දී තිබුනත්, අවි ආයුධ සැපයීම ආදිය කරමින් STF කරුණා පිල සමග ඉතා සමීපව කටයුතු කර තිබේ.

“දශක තුනක් තිස්සේ සිදු කරන ලද බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධයෙන් දිගින් දිගටම STF නම් කරමින් අපේ වෘත්තීය සගයන් විසින් සකස් කරන ලද වාර්තා අඩංගු අපේ ඇමිණුම බැලූ කල, STF දැලින් රිංගා ගියේ කෙසේදැයි මට සිතා ගත නොහැක. එහෙත් STF නිලධාරීන්ට පාරිතෝෂික ලෙසින් සාමසාධක රැකියා දෙනු ලැබේ,” යි යැස්මින් සූකා පැවසුවාය.

ITJP පිළිබඳ පසුබිම් තොරතුරු

ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානව හිමිකම් නීති උල්ලංඝනය සම්බන්ධයෙන් ITJP ජාත්‍යන්තර ගවේෂකයන් විසින් 2013 සිට ලේඛනගත කොට ඇති අතර, ශ්‍රී ලංකාවේ අවසන් යුද්ධය සහ ඉන් පසුව කාල සීමාව පිළිබඳව රටින් පිටත විශාලතම දත්ත ගබඩාව මේවන විට ඔවුන් සතුව පවතී.

සිවිල් යුද්ධයේ අවසානය වූ 2009 දී ඉටු කළ කාර්ය භාරය සම්බන්ධයෙන් ලතින් ඇමරිකාවේ ශ්‍රී ලංකා තානාපති ජගත් ජයසූරියට එරෙහිව ITJP විසින් බ්‍රසීලයේ, කොලොම්බියාවේ, පීරුවේ සහ චිලියේ යුද අපරාධ නඩු 4ක් පවරා තිබේ[1].

රෝහල්වලට නොකඩවා පහර දීම, වධබන්ධන, ලිංගික ප්‍රචණ්ඩතාව, බලහත්කාර අතුරුදහන් කිරීම් සහ නඩු නොඅසා ඝාතනය කිරීම් සිදු කළ ඒකක වලට අණ දුන් නිලධාරියා ලෙසින් ජෙනරාල් ජයසූරිය පුද්ගලයකු ලෙසින් සාපරාධී වගකීමෙන් බැඳෙන බව ITJP නඩුකරයෙන් චෝදනා කෙරේ.

[1] සුරිනාම් හි පවරන ලද පස්වැනි නඩුව ප්‍රතික්ෂේප කරන ලද අතර තානාපති කාර්යාලය හා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කර තිබූ ලෙස ඔහු සැබවින්ම ආර්ජන්ටිනාව සඳහා පත් කර තිබුනේ නැත.

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT